LIBRARY

පාර්ලිමේන්තුවේ පුස්තකාලය
කොළඹ.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 1 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජනවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 90 යි　　　　තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 1 වන දින]

එල්. ඩී.—ඕ. 58/77.

**අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම සඳහා ද; පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ද; සාධාරණ වෙළෙඳ සමාචාර ඇති කිරීම සඳහා ද; ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා ද; 1961 අංක 62 දරන වෙළෙන්දන්ට බලපත්‍ර දීමේ පනත පරිච්ඡින්න කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** (1) මේ පනත 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දින.*

(2) (අ) මේ පනතේ I වන, II වන සහ IV වන කොටස්වල විධිවිධාන මේ පනත පනවනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ප්‍රකාශනයක් මගින් මේ පනතේ III වන කොටසේ විධිවිධාන ජනාධිපතිවරයා විසින් කලින් කල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. එවැනි ප්‍රකාශනයක් පළ කරනු ලැබූ විට එකී කොටසෙහි විධිවිධාන නොපමාව ම හෝ ඒ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන යම් දිනයක, ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ එසේ සඳහන් කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් කොටසක හෝ කොටස්වල ක්‍රියාත්මක විය යුතු අතර, ඒ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

## I වන කොටස

## වෙළෙඳාම විධිමත් කිරීම

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා මෙහි මින් මතු "කොමසාරිස් වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ කොමසාරිස්වරයකු නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය. *නිලධරයන් පත්කිරීම.*

(2) අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයන් සහ සහකාර කොමසාරිස්වරයන් ද, වෙනත් නිලධරයන් ද මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වන සංඛ්‍යාවක් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(3) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ම සහ සහකාර කොමසාරිස්වරයෙක් ම ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී හෝ කටයුතු කිරීමේ දී කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

1ඒ—37,671—13,800 (78/12)

(4) මේ පනතින් හෝ මේ පනත යටතේ කොමසාරිස්වරයා සතු කරනු ලැබූ හෝ ඔහුට නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ බලතල, කාර්ය හෝ කටයුතු සියල්ල ම හෝ ඉන් කිසිවක් සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ම, සහකාර කොමසාරිස්වරයෙක් ම, ස්වකීය බලසීමා ප්‍රදේශය ඇතුළත කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි ය.

බෙදා හැරීමේ ක්‍රමය.

3. (1) කොමසාරිස්වරයාගේ මතය අනුව, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙහි, ආනයනය කිරීමෙහි, විකිණීමෙහි සහ පරිභෝජනය කිරීමෙහි ලා සම්බන්ධතාවක් දක්වන්නේ යම් තැනැත්තන් ද ඒ තැනැත්තන් විමසා කොමසාරිස්වරයා විසින් ඒ භාණ්ඩය බෙදා හැරීමේ ක්‍රමයක් ගැන තීරණය කළ හැකි ය. එවැනි යම් බෙදා හැරීමේ ක්‍රමයක දී භාණ්ඩවල ලේබල් ඇලවීම, මිල ලකුණු කිරීම සහ භාණ්ඩ ඇසිරීම නියම කරමින් කොමසාරිස්වරයා විසින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) එවැනි සෑම බෙදා හැරීමේ ක්‍රමයක් ම ගැසට් පත්‍රයෙහි ද යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය.

බෙදා හැරීමේ ක්‍රමය ක්‍රියාත්මක වීම පිළිබඳ පරීක්ෂණ.

4. (1) කොමසාරිස්වරයා විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ ලියවිල්ලකින් වූ යම් පැමිණිල්ලක් ලැබුණු විට හෝ යම් භාණ්ඩයක් බෙදා හැරීමේ ක්‍රමය ක්‍රියාත්මක වීම පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් පරීක්ෂණයකින් පසුව එවැනි යම් බෙදා හැරීමේ ක්‍රමයක් වෙනස් කිරීම හෝ සකස් කිරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකි ය. එවැනි වෙනස් කිරීමක් හෝ සකස් කිරීමක් 3 (2) වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි පළ කරනු ලැබිය යුතු ය.

(3) යම් භාණ්ඩයක් බෙදා හැරීමේ ක්‍රමයෙහි විධිවිධාන කිසිවක් කඩ කරන යම් වෙළෙන්දෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව මිස යම් වෙළෙන්දකුට විරුද්ධව (3) වන උපවගන්තිය යටතේ නඩු පවරනු නොලැබිය යුතු ය.

භාණ්ඩ බෙදා හැරීම යනාදිය අධ්‍යයනය කිරීම කොමසාරිස් වරයා විසින් කළ හැකි බව.

5. කොමසාරිස්වරයා විසින්—

(අ) යම් භාණ්ඩයක්, සතුටුදායක තත්ත්වයකට ද සාධාරණ මිලකට ද සෑහෙන ප්‍රමාණයකට ද පාරිභෝගිකයාට ලබාගත හැකි වන බවට සහතික වන පරිදි භාණ්ඩ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම භාර ගැනීම ද ;

(ආ) (අ) වන ඡේදයෙහි විස්තර කර ඇති කාර්යය සඳහා පාරිභෝගිකයන්ගේ සංවිධාන ද ඇතුළු රාජ්‍ය හෝ වෙනත් සංවිධාන නංවාලීම, ඒවාට සහාය දීම සහ ඒවා උනන්දු කිරීම ද ;

(ඇ) 10 වන වගන්තියෙහි විස්තර කර ඇති කාර්යය සඳහා කොමසාරිස්වරයා සමඟ ගිවිසුම්වලට එළඹීමට වෙළෙඳුන්ගේ සමිතිවලට සහාය දීම සහ ඒවා උනන්දු කිරීම ද

කරනු ලැබිය හැකි ය.

භාණ්ඩවල මිල ලකුණු කිරීම, ලේබල් ඇලවීම සහ භාණ්ඩ ඇසිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් නිෂ්පාදකයන්ට සහ වෙළෙඳුන්ට විධාන නිකුත් කළ යුතු බව.

6. (1) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම පිණිස යම් භාණ්ඩවල ලේබල් ඇලවීම, මිල ලකුණු කිරීම සහ එම භාණ්ඩ ඇසිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් නිෂ්පාදකයන්ට සහ වෙළෙඳුන්ට සාමාන්‍ය විධාන නිකුත් කළ හැකි අතර, එසේ ම නිෂ්පාදකයන්ගේ හෝ වෙළෙඳුන්ගේ යම් පන්තියකට නිකුත් කරනු ලබන සාමාන්‍ය විධාන මගින් හෝ යම් විශේෂ නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු වෙත නිකුත් කරනු ලබන විශේෂ විධාන මගින් හෝ, අවස්ථාවෝචිත පරිදි, ඒ පන්තියට හෝ ඒ නිෂ්පාදකයාට හෝ වෙළෙන්දාට අදාළව—

(අ) යම් එක් දිනයක දී විකිණිය යුතු යම් භාණ්ඩයක උපරිම ප්‍රමාණය :

(ආ) ඒ භාණ්ඩය විකිණිය හැක්කේ යම් කාලවල දී හා ස්ථානවල දී ද ඒ කාලයන් සහ ස්ථාන ; සහ

(ඇ) ඒ භාණ්ඩය නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ඒ භාණ්ඩයෙහි ලේබල් ඇලවීම හෝ ඒ භාණ්ඩය විකිණීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි

නිශ්චය කරනු ලැබිය හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම සාමාන්‍ය විධානයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. තව ද යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු වෙත කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම විශේෂ විධානයක් ම ලියවිල්ලකින් විය යුතු අතර එය නිකුත් කරනු ලබන්නේ යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු වෙත ද ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා වෙත භාර දෙනු ලැබිය යුතු ය. එවැනි යම් විධානයක් ඒ නිෂ්පාදකයාගේ හෝ වෙළෙන්දාගේ ව්‍යාපාරික ස්ථානයෙහි ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවන ලද නම් එය ඔහු වෙත භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. තැපෑලෙන් එය භාර දෙන ලද බව ඔප්පු කිරීමේ දී විධානය ඇතුළත් ලේඛනය විධිමත් පරිදි ලිපිනය යොදා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් අනුව කටයුතු කිරීම පැහැර හරින යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) යම් භාණ්ඩයක යම් ලේබලයක්, විස්තරයක් හෝ ලකුණු කරන ලද මිලක් ඉවත් කරන, වෙනස් කරන, කපාහරින, මකා හරින හෝ විකෘති කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ලකුණු කරන ලද මිලට වැඩියෙන් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම.

7. 6 වන වගන්තිය යටතේ භාණ්ඩයෙහි ලකුණු කරන ලද මිලට වැඩි මිලකට යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

නිශ්චිත ප්‍රමිතිවලට වඩා බාල භාණ්ඩ. නිෂ්පාදනය කිරීම හෝ විකිණීම.

8. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් නිර්ණය කරනු ලබන ප්‍රමිතිවලට සහ පිරිවිතරවලට අනුකූල නොවන යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම හෝ විකිණීම පිළිබඳ පැමිණිලි කොමසාරිස්වරයා විසින් විභාග කරනු ලැබිය හැකි ය. යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ලංකා ප්‍රමිති කාර්යාංශය මගින් යම් ප්‍රමිති හා පිරිවිතර නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ප්‍රමිති සහ පිරිවිතර, මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිර්ණය කරන ලද ප්‍රමිති සහ පිරිවිතර ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පැමිණිල්ලක්, එම විකිණීමෙන් දින හතක් ඇතුළත දී කොමසාරිස්වරයා වෙත ලැබෙන පරිදි ලියවිල්ලකින් ඔහු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) එවැනි පැමිණිල්ලක් පිළිබඳව පවත්වනු ලබන යම් විභාගයක දී, එම පැමිණිල්ල කරනු ලැබුවේ යම් නිෂ්පාදකයකුට හෝ වෙළෙන්දකුට විරුද්ධව ද ඒ නිෂ්පාදකයාට හෝ වෙළෙන්දාට, කොමසාරිස්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ අනුයෝජිතයකු මගින් කරුණු කියා සිටීමට අවස්ථාවක් දිය යුතු ය.

(4) කොමසාරිස්වරයා විසින් නිර්ණය කරන ලද හෝ නීර්ණය කරන ලදැයි සැලකෙන ප්‍රමිතිවලට හෝ පිරිවිතරවලට අනුකූල නොවන භාණ්ඩයක් නිෂ්පාදනය කර ඇතැයි හෝ විකුණා ඇතැයි විභාගයෙන් පසුව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, අතෘප්තියට පත් පාර්ශ්වකරුට වන්දි ගෙවන ලෙස හෝ එම භාණ්ඩය ප්‍රතියෝජනය කරන ලෙස හෝ ඒ භාණ්ඩය සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස හෝ කොමසාරිස්වරයා විසින් ඒ නිෂ්පාදකයාට හෝ වෙළෙන්දාට නියම කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ලියවිල්ලකින් කළ යුතු අතර, එය, ලියාපදිංචි තැපෑලෙන් ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා වෙත දන්වා යැවිය යුතු ය.

නියමය අනුව කටයුතු කිරීම පැහැර හැරීම වරදක් බව.

9. 8 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අනුව කටයුතු කිරීම යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

උපරිම මිල යනාදිය පිළිබඳ කටයුතු සැලසීම පිණිස ගිවිසුම.

10. (1) කොමසාරිස්වරයා විසින්—

(අ) යම් භාණ්ඩයක් විකිණීම නොකළ යුත්තේ යම් උපරිම මිලකට වැඩියෙන් ද ඒ උපරිම මිල;

(ආ) නිෂ්පාදනය කරනු ලබන, විකුණනු ලබන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් භාණ්ඩයක ප්‍රමිතිය සහ පිරිවිතර;

(ඈ) යම් එක් දිනයක දී විකිණිය යුතු යම් භාණ්ඩයක උපරිම ප්‍රමාණය ;

(ඈ) ඒ භාණ්ඩය විකිණිය හැක්කේ යම් කාලවල දී හා ස්ථාන වල දී ද ඒ කාලයන් හා ස්ථාන ; සහ

(ඉ) ඒ භාණ්ඩය නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ඒ භාණ්ඩ යෙහි ලේබල් ඇලවීම හෝ ඒ භාණ්ඩය විකිණීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි

පිළිබඳ කටයුතු සැලසීම පිණිස තමා අවශ්‍ය යයි සලකන යම් ලිඛිත ගිවිසුම්වලට යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු හෝ යම් නිෂ්පාදකයන්ගේ හෝ වෙළෙන්දන්ගේ සමිතියක් හෝ සමග එළඹිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා සහ යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු හෝ නිෂ්පාදකයන්ගේ හෝ වෙළෙන්දන්ගේ යම් සමිතියක් අතර එළඹුන සෑම ලිඛිත ගිවිසුමක් ම ඒ නිෂ්පාදකයාගේ හෝ වෙළෙන්දාගේ සෑම බලය ලත් බෙදා හරින්නකු කෙරෙහි ද එවැනි සමිතියක සෑම සාමාජිකයකු කෙරෙහි ද එම ගිවිසුම කළ අවස්ථාවේ ඔහු සාමාජිකයකුව සිටිය ද නොසිටිය ද ඔහු ඒ ගිවිසුමට පාර්ශ්වකරුවකු වූවාක් මෙන් අනුගම්‍ය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා සමඟ එළඹුනු යම් ගිවිසුමක යම් විධිවිධානයක් කඩ කරන සෑම නිෂ්පාදක යකු ම හෝ වෙළෙන්දකු ම හෝ ඒ නිෂ්පාදකයාගේ නැතහොත් වෙළෙන්දාගේ යම් බලය ලත් බෙදා හරින්නකු හෝ සමිතියක් හෝ එහි යම් සාමාජිකයකු හෝ මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා සමඟ එළඹෙන සෑම ගිවිසුමක් ම, කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කළ යුතු ය. තව ද අවස්ථාවෝචිත පරිදි ඒ නිෂ්පාදකයාගේ හෝ වෙළෙන්දාගේ හෝ ඒ බලයලත් බෙදා හරින්නාගේ හෝ එම සමිතියේ සාමාජිකයන්ගේ නම් සහ විස්තරය දැක්වෙන උප ලේඛනයක් එයට ඇතුළත් විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා සමඟ එළඹෙන සෑම ගිවිසුමක් ම, එය යම් තදනන්තර දිනයක දී ක්‍රියාත්මක විය යුතු බවට එහි විධිවිධාන සලසා ඇත්නම් මිස එම ගිවිසුමේ දිනයෙහි සිට බලාත්මක විය යුතු ය.

(6) සුදුසු යයි කොමසාරිස්වරයා කල්පනා කරන අවස්ථාවක, මේ වගන්තිය යටතේ සාදන ලද යම් ගිවිසුමක් ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය. ගිවිසුමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුම පළ කරනු ලැබූවේ යම් ගැසට් පත්‍රයක ද ඒ ගැසට් පත්‍රයෙහි පිටපතක් යම් අධිකරණ යක දී ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එය එසේ නොවේනැයි ඔප්පු කරනු ලබන තුරු, එය ඒ ගිවිසුමෙහි ඇතුළත් කරුණු පිළිබඳ සාක්ෂිය විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ යම් නඩු පැවරීමක කාර්යය සඳහා යම් නැනැත්තෙක් යම් නිෂ්පාදකයකුගේ හෝ වෙළෙන්දාගේ බලය ලත් බෙදා හරින්නකු හෝ වෙළෙඳුන්ගේ හෝ නිෂ්පාදක යන්ගේ යම් සමිතියක සාමාජිකයකු හෝ බවට කොමසාරිස්වරයා විසින් දෙනු ලබන සහතිකයක් ඒ නැනැත්තා බලයලත් බෙදා හරින්නකු හෝ එවැනි සමිතියක සාමාජිකයකු හෝ බවට අධිකර ණයකට මුල් බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතු ය.

භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම වරදක් බව.

11. (1) විකිණීමේ කාර්ය සඳහා තම සන්තකයෙහි හෝ භාර යෙහි හෝ තම පාලනය යටතේ හෝ යම් භාණ්ඩයක් ඇති කිසිම වෙළෙන්දකු විසින් එම භාණ්ඩය විකිණීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කිරීම සම්බන්ධ යෙන් යම් වෙළෙන්දකුට විරුද්ධව යම් නඩු පැවරීමක දී—

(අ) ප්‍රශ්නයට අදාළ අවස්ථාවේ දී භාණ්ඩයෙහි සැහෙන ප්‍රමාණ යක් තමා විසින් සපයන ලද බව හෝ ප්‍රමාණය සැපයීම පිණිස අවශ්‍ය ප්‍රමාණයක් තමා සන්තකයෙහි නොතිබුණ බව ; හෝ

(ආ) එම භාණ්ඩය පිළිබඳ වෙළෙඳ ව්‍යාපාරය, තොග වෙළෙන් දකු ලෙස පමණක් තමා විසින් පවත්වා ගෙන යන ලද බව සහ ගැනුම්කරු විසින් ඉල්ලා සිටි ප්‍රමාණය විකිණීම, තොග වෙළෙඳ ව්‍යාපාරයක සාමාන්‍ය පරිචයට පටහැනි විය හැකිව තිබුණු බව ; හෝ

(ඇ) ප්‍රශ්නයට අදාළ ඒ අවස්ථාවේ දී ඒ භාණ්ඩය විකිණීම යම් ලිඛිත නීතියක යම් විධිවිධානවලට හෝ 6 වන වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයකට පටහැනි විය හැකිව තිබුණු බව

ඔප්පු කිරීම චූදිතයාට ප්‍රමාණවත් විත්තිවාචකයක් විය යුතු ය.

වෙළෙඳාමේ කාර්ය සඳහා ඇති යම් භාණ්ඩයක් සන්තකයෙහි නොමැති බව කීම හෝ ඒ භාණ්ඩ යම් කොන්දේසියකට යටත්ව විකිණීම හෝ වරදක් බව.

12. වෙළෙඳාමේ කාර්ය සඳහා යම් භාණ්ඩයක්, තම සන්තක යෙහි හෝ භාරයෙහි හෝ තම පාලනය යටතේ ඇති කිසිම වෙළෙන්දකු විසින්—

(අ) ඒ භාණ්ඩය තම සන්තකයෙහි නොමැති බව කියා සිටීම ; හෝ

(ආ) ගැනුම්කරු විසින් ඒ භාණ්ඩයෙහි මිල නොපමාව ගෙවිය යුතු ය යන කොන්දේසිය හැර, වෙනත් යම් භාණ්ඩයක් මිලට ගැනීම නියම කිරීමේ හෝ යම් සේවාවක් වෙනු වෙන් යම් ගෙවීමක් කිරීමේ කොන්දේසියකට හෝ වෙනත් යම් කොන්දේසියකට හෝ යටත්ව ඒ භාණ්ඩය විකිණීම සඳහා ඉදිරිපත් කිරීම

නොකළ යුතු ය.

යම් වෙළෙන්දකු හෝ තැනැත්තකු විසින් භාණ්ඩ රැස්කර තබා ගැනීම වරදක් බව.

**13.** (1) කිසිම වෙළෙන්දකු විසින් යම් භාණ්ඩයක් කොමසාරිස්වරයාගේ මතය අනුව එම වෙළෙන්දාගේ සාමාන්‍ය අවශ්‍යතාවන් ඉක්මවන ප්‍රමාණයකින් ඔහුගේ ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක හෝ සඟවා තබා ගැනීම නොකළ යුතු ය.

(2) කිසිම වෙළෙන්දකු විසින් යම් භාණ්ඩයක්, කොමසාරිස්වරයාගේ මතය අනුව—

(අ) ඔහුගේ පෞද්ගලික පරිභෝජනය සහ/හෝ ඔහුගේ ගෘහයේ සාමාජිකයන්ගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණය; හෝ

(ආ) එම වෙළෙන්දාගේ සාමාන්‍ය වෙළෙඳ කටයුතුවලට අවශ්‍ය ප්‍රමාණය; හෝ

ඉක්මවන ප්‍රමාණයකින් ස්වකීය ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක, ස්වකීය සන්තකයෙහි හෝ භාරයෙහි හෝ පාලනය යටතේ තබා නොගත යුතු ය.

(3) වෙළෙන්දකු නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින් යම් භාණ්ඩයක, කොමසාරිස්වරයාගේ මතය අනුව ඒ තැනැත්තාගේ සාමාන්‍ය පෞද්ගලික අවශ්‍යතාව ඉක්මවන ප්‍රමාණයක් ස්වකීය සන්තකයෙහි හෝ භාරයෙහි හෝ පාලනය යටතේ තබා නොගත යුතු ය.

පාලිත මිලට වැඩි මිලකට භාණ්ඩයක් විකිණීම වරදක් බව.

**14.** ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන නියමයක් මගින් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් නියම කරන ලද, අවස්ථාවෝචිත පරිදි උපරිම සිල්ලර හෝ තොග මිලට වැඩි මිලකට ඒ භාණ්ඩය කිසිම වෙළෙන්දකු විසින් නොවිකිණිය යුතු ය.

වෙළෙන්දා මිල ලැයිස්තුව ප්‍රදර්ශනය කළ යුතු බව.

**15.** ස්වකීය ව්‍යාපාරික ස්ථානයෙහි විකිණීම සඳහා තිබෙන සෑම භාණ්ඩයක ම, අවස්ථාවෝචිත පරිදි උපරිම සිල්ලර හෝ තොග මිල දක්වෙන දැන්වීමක් සෑම වෙළෙන්දකු විසින් ම ඔහුගේ ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය.

මිලට ගැනුම්කරුවන්ට වෙළෙන්දා විසින් කුවිතාන්සි නිකුත් කළ යුතු බව.

**16.** යම් භාණ්ඩයක් විකුණන සෑම වෙළෙන්දකු විසින් ම, ඒ භාණ්ඩය මිලට ගැනුම්කරු ඉල්ලා සිටි විට—

(අ) විකිණීම කළ දිනය;

(ආ) විකුණන ලද එම භාණ්ඩ ප්‍රමාණය;

(ඇ) එම ප්‍රමාණය සඳහා ගෙවන ලද මිල; සහ

(ඈ) ගනුදෙනුවේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග

දැක්වෙන කුවිතාන්සියක් එම මිලට ගැනුම්කරු වෙත නිකුත් කළ යුතු ය.

2—ඒ 37671 (78/12)

වෙළෙන්දා විසින් දැන්වීම් පුවරුවක් සැපයිය යුතු බව.

17. (1) මේ පනත යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන යම් දැන්වීමක්, විධානයක් හෝ කරනු ලබන යම් අවවාදයක් ප්‍රදර්ශනය කිරීම සඳහා දැන්වීම් පුවරුවක් සෑම වෙළෙන්දකු විසින් ම, ස්වකීය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන තැනක තැබිය යුතු ය.

(2) සෑම වෙළෙන්දකු විසින් ම, කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ ඒ වෙළෙන්දා වෙත නිකුත් කරන ලද යම් දැන්වීමක්, විධානයක් හෝ අවවාදයක් ඒ දැන්වීම් පුවරුවෙහි ඇලවීම හෝ ඇලවීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(3) කොමසාරිස්වරයාගේ විධානය හෝ අධිකාරිය යටතේ ක්‍රියා කරන තැනැත්තකු නොවන, එවැනි දැන්වීමක්, විධානයක් හෝ අවවාදයක් ඉවත් කරන, වෙනස් කරන, කවුගා දමන, මකා දමන හෝ විකෘති කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

නොමග යවන සුළු හෝ කපටි පැවැත්ම.

18. කිසිම වෙළෙන්දකු විසින් වෙළෙඳාමක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කරගෙන යාමේ දී, නොමග යවන සුළු හෝ කපටි වූ හෝ පැවැත්මක් අනුගමනය නොකළ යුතු ය.

ව්‍යාජ ලෙස දක්වා සිටීම.

19. බඩු හෝ සේවා සැපයීම නැතහොත් සිදුවිය හැකි එබඳු සැපයීමක් සම්බන්ධයෙන් වූ හෝ බඩු හෝ සේවා සැපයීම හෝ ප්‍රයෝජනයට ගැනීම යම් ආකාරයකින් නංවාලීම සම්බන්ධයෙන් වූ හෝ වෙළෙඳාමක් නැතහොත් වෙළෙඳ ව්‍යාපාරයක් කර ගෙන යාමේ දී—

(අ) බඩු හෝ සේවා යම් නිශ්චිත ප්‍රමිතියක, තත්ත්වයක, හෝ ශ්‍රේණියක ඒවා බව හෝ බඩු නිශ්චිත මෝස්තරයක හෝ ආකෘතියක ඒවා බව හෝ අසත්‍ය ලෙස දක්වා සිටින ; හෝ

(ආ) බඩු අලුත් ඒවා බව අසත්‍ය ලෙස දක්වා සිටින ; හෝ

(ඇ) බඩුවල හෝ සේවාවල නොමැති ඇපකාරත්වය, අනුමතය, කාර්ය සාධනය, ස්වභාවය, උපකාරක, ප්‍රයෝජන හෝ ප්‍රතිලාභ ඒවායේ ඇතැයි කියා සිටින ; හෝ

(ඈ) තමාට නොමැති ඇපකාරත්වයක්, අනුමතයක් හෝ සම්බන්ධතාවක් තමාට ඇතැයි කියා සිටින ; හෝ

20. (1) කිසිම වෙළෙන්දකු විසින් වෙළෙඳාමක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් කර ගෙන යාමේ දී ජාතික ආර්ථිකයේ යහපත පිණිස ජාතික මිල කොමිෂන් සභාව විසින් දෙනු ලබන ලිඛිත අනුමතය ඇතිව මිස, අනන්‍ය ගනුදෙනු කිරීමේ කටයුතුවල නොයෙදිය යුතු ය. අනන්‍ය ගනුදෙනුව.

(2) යම් වෙළෙන්දකු බඩු හෝ සේවා සපයන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා—

(i) ඒ වෙළෙන්දාගේ තරගකරුවකුගෙන් බඩු හෝ සේවා ලබා නොගන්නා බවට හෝ සීමිත ප්‍රමාණයක් පමණක් ලබා ගන්නා බවට ; හෝ

(ii) ඒ වෙළෙන්දා විසින් බඩු සපයනු ලබන අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට—

(අඅ) යම්කිසි තැනැත්තන්ට හෝ තැනැත්තන්ගේ යම් කිසි පන්තියකට ඇතුළත් තැනැත්තන්ට බඩුවලින් කිසිවක් නොසපයන බවට හෝ සීමිත ප්‍රමාණයකට පමණක් සපයන බවට ; හෝ

(ආආ) වෙනත් තැනැත්තන්ට බඩුවලින් කිසිවක් සැපයීම එක්තරා ස්ථානවල දී නොකරන බවට හෝ සීමිත ප්‍රමාණයකට පමණක් සපයන බවට ;

වූ කොන්දේසිය මත හෝ ගිවිසුමකට, එකඟවීමකට හෝ සම්මුතියකට යටත්ව ඒ තැනැත්තාට ඒ වෙළෙන්දා—

(අ) යම් බඩු හෝ සේවා සපයයි නම් ; හෝ

(ආ) යම් බඩු හෝ සේවා සැපයීම සඳහා මිලක් අය කරයි නම් ; හෝ

(ඇ) යම් බඩු හෝ සේවා සැපයීමට අදාළව වට්ටමක්, දීමනාවක්, ප්‍රතිදානයක් හෝ ණයක් දෙයි නම් හෝ සලසයි නම් ; නැතහොත්

(ඈ) යම් ලිඛිත නීතියක් යටතේ වෙළෙන්දාට බලපත්‍රයක්, අවසර පත්‍රයක්, අධිකාරියක් හෝ ලියාපදිංචියක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම නිසා නොවේ නම් නීත්‍යනුකූලව සැපයිය නොහැකි වර්ගයක බඩු හෝ සේවා තැනැත්තකුට සැපයීමේ කොන්දේසිය ලෙස වෙනත් බඩු හෝ සේවා පිළිබඳ ඒ තැනැත්තාගේ අවශ්‍යතා සියල්ල හෝ ඉන් කොටසක් කෙළින්ම හෝ නොඑසේව ඒ වෙළෙන්දාගෙන් ලබා ගත යුතු බවට නියම කරයි නම් ; හෝ

(ඉ) බඩු හෝ සේවා තැනැත්තකුට සැපයීමේ කොන්දේසියක් ලෙස, වෙනත් බඩු හෝ සේවා පිළිබඳ ඒ තැනැත්තාගේ අවශ්‍යතා සියල්ල හෝ ඉන් කොට

සක් තෙළින්ම හෝ නොඑසේව දෙවනු තැනැත් තකුගෙන් ලබාගත යුතු බවට නියම කරයි නම්,

ඒ වෙළෙන්දා අනන්‍ය ගනුදෙනුවල යෙදී සිටින්නේ ය.

මිල විශේෂණය.

21. (1) කිසිම වෙළෙන්දකු විසින්, වෙළෙඳාමක දී හෝ වෙළෙඳ ව්‍යාපාරයක දී—

(අ) බඩු සඳහා අය කරනු ලබන මිලට ; හෝ

(ආ) බඩු සැපයීමට අදාළව දෙනු ලබන යම් වට්ටම්වලට, දීමනා වලට, ප්‍රතිදානවලට හෝ ණයවලට ; හෝ

(ඇ) බඩු සම්බන්ධයෙන් සේවා හෝ පහසුකම් සැලසීමට ; හෝ

(ඈ) බඩු සම්බන්ධයෙන් සලසන ලද සේවා හෝ පහසුකම් වෙනුවෙන් ගෙවීම් කිරීමට

අදාළව, සමාන වර්ගයේ සහ තත්ත්වයේ බඩු මිලට ගැනුම්කරුවන් අතර, විශේෂණයක් කිරීම, ඒ වෙළෙන්ද විසින් බඩු සපයන හෝ ඒ තැනැත්තන් විසින් බඩු සපයන වෙළෙඳ පොළක තරඟය සැහෙන ලෙස අඩු කිරීමේ ප්‍රතිඵලය තිබිය හැකි ප්‍රමාණයකින් හෝ පුනරාවර්තන නැතහොත් ක්‍රමානුකූල ස්වභාවයකින් පවතී නම්, ඒ විශේෂණය කිරීම නොකළ යුතු ය.

(2) (අ) මිලට ගැනුම්කරුවන් වෙත බඩු සපයනු ලබන්නේ යම් ස්ථානවලට ද, යම් ක්‍රම මගින් ද, යම් ප්‍රමාණවලට ද ඒ ස්ථාන, ක්‍රම හෝ ප්‍රමාණ සම්බන්ධයෙන් වූ වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය කිරීමේ, බෙදාහැරීමේ, විකිණීමේ හෝ බාරදීමේ වියදමෙහි හෝ ඇතිවිය හැකි වියදමෙහි වෙනස්කම් සඳහා සාධාරණ ඉඩ හැරීමක් පමණක් විශේෂයෙන් ඇති කරයි නම් ; හෝ

(ආ) සැපයුම්කරුගේ තරඟකරුවකු විසින් පිරිනමනු ලබන මිලක් හෝ ප්‍රතිලාභයක් දැරීම පිණිස සද්භාවයෙන් කරනු ලබන ක්‍රියාවකින් විශේෂණය සංයුක්ත වේ නම්

(1) වන උපවගන්තියේ විධිවිධාන ඒ විශේෂණය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තක දී, ඒ උපවගන්තිය, (2) වන උපවගන්තියේ හේතුවෙන් යම් විශේෂණයක් සම්බන්ධයෙන් අදාළ නොවන බව ඔප්පු කිරීමේ භාරය, (1) වන උපවගන්තිය එසේ අදාළ නොවේ යයි කියා සිටින පාර්ශ්වකරු වෙත පැවරෙන්නේ ය.

(4) වෙළෙඳාමක දී හෝ වෙළෙඳ ව්‍යාපාරයක දී තැනැත්තකු විසින්—

(අ) (1) වන උපවගන්තිය මගින් තහනම් කර ඇති ආකාරයකට විශේෂණය කිරීමට වෙළෙන්දකු දැනුවත්ව පෙළඹවීම හෝ පෙළඹවීමට තැත් කිරීම ; හෝ

(ආ) ඒ උපවගන්තියෙන් තහනම් කර ඇති විශේෂණයක ප්‍රතිලාභය තම දැනීම අනුව තමා වෙත ලැබීමේ ප්‍රතිඵලය තිබිය හැකි යම් ගනුදෙනුවකට ඇතුළත් වීම

නොකළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීම සඳහා, තැනැත්තකුට විරුද්ධ වූ යම් නඩු කටයුත්තක දී, අදාළ විශේෂණය (1) වන උපවගන්තිය මගින් තහනම් නොකරන ලද බව (2) වන උපවගන්තියේ හේතුවෙන් තමා සාධාරණව විශ්වාස කළ බව ඒ තැනැත්තා ඔප්පු කළහොත් එය ප්‍රමාණවත් විත්තිවාචකයක් විය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ වීමෙන් යම් වෙළෙන්දකු නිදහස් කිරීම ජාතික ආර්ථිකයේ යහපත පිණිස යෝග්‍ය යයි ජාතික මිල කොමිෂන් සභාව සලකන අවස්ථාවක, ඒ කොමිෂන් සභාව විසින් ඒ වෙළෙන්දා, එම විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

22. (1) වෙළෙඳ ව්‍යාපාරයක දී වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට සේවා සැපයීම සඳහා වූ සෑම ගිවිසුමකම නිසි සැලකිල්ල සහ නිපුණත්වය ඇතිව ඒ සේවා සලසනු ලබන බවට ද, ඒ සේවාවන්ට අදාළව සපයනු ලබන යම් ද්‍රව්‍ය, ඒවා සපයනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයට සාධාරණව සුදුසු වන බවට ද ව්‍යංගික ප්‍රතිඥාභාරයක් ඇත්තේ ය. සේවා සැපයීම සම්බන්ධයෙන් අදාළ ප්‍රතිඥා.

(2) වෙළෙඳ ව්‍යාපාරයකදී වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට සේවා සපයන්නා වූ ද සේවා අවශ්‍ය වන්නේ යම් විශේෂ කාර්යයක් සඳහා ද ඒ කාර්යය හෝ සේවා මගින් ලබා ගැනීමට තමා අපේක්ෂා කරන ප්‍රතිඵලය හෝ පාරිභෝගිකයා විසින් ප්‍රකාශිතව ම හෝ ව්‍යංගයෙන් හෝ වෙළෙන්දාට දැන ගැනීමට සලස්වන්නා වූ ද අවස්ථාවක, වෙළෙන්දාගේ නිපුණත්වය හෝ විනිශ්චය ගැන පාරිභෝගිකයා විශ්වාසය නොතබන බව හෝ ඔහු එසේ විශ්වාසය තැබීම යුක්ති සහගත නොවන බව හෝ අවස්ථාගත කරුණුවලින් පෙනී යන අවස්ථාවල දී හැර, සේවා සැපයීම සඳහා වූ ගිවිසුම යටතේ සපයන ලද සේවා සහ ඒ සේවාවන්ට අදාළව සපයන ලද යම් ද්‍රව්‍ය ඒ කාර්යය සඳහා සාධාරණ ලෙස සුදුසු බවට හෝ ඒ ප්‍රතිඵලය ලැබෙතැයි සාධාරණව අපේක්ෂා කළ හැකි ස්වභාවයක හෝ තත්ත්වයක ඒවා බවට හෝ ව්‍යංගික ප්‍රතිඥාභාරයක් ඇත්තේ ය.

(3) මේ වගන්තියෙහි, "සේවා" යන්නෙන්—

(අ) බඩු සෑදීම, නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම, නිවාරණය කිරීම, සකස් කිරීම, පිරිසිදු කිරීම හෝ වෙනස් කිරීම ; හෝ

(ආ) බඩු බෙදාහැරීම ; හෝ

(ඇ) බඩු ප්‍රවාහණය කිරීම

මගින් කරනු ලබන සේවා අදහස් වේ.

ඒකාධිකාරි පාලනය.

23. (1) බඩු හෝ සේවා සඳහා වූ වෙළෙඳ පොලක් තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු සමග හෝ සැහෙන ප්‍රමාණයකට පාලනය කිරීමට තත්ත්වයක් ඇති වෙළෙන්දකු ඒ තත්ත්වයේ සිටීමේ හේතුවෙන් ඒ වෙළෙඳ පොලට අදාළව තමාට ඇති බලය—

(අ) ඒ වෙළෙඳ පොළෙහි හෝ වෙනත් වෙළඳ පොලක හෝ තරඟ කරුවකු ඉවත් කිරීමට හෝ ඔහුට සැහෙන අලාභ කිරීමට ; හෝ

(ආ) ඒ වෙළෙඳ පොලට හෝ වෙනත් වෙළෙඳ පොලකට යම් තැනැත්තකු ඇතුල්වීම වැළැක්වීමට ; හෝ

(ඇ) ඒ වෙළෙඳ පොලෙහි හෝ වෙනත් වෙළෙඳ පොලක යම් තැනැත්තකු තරඟකාරී පැවැත්මක යෙදීම නතර කිරීමට නැතහොත් වැළැක්වීමට ; හෝ

උපයෝගි කර නොගත යුතු ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ වීමෙන් යම් වෙළෙන්දකු නිදහස් කිරීම ජාතික ආර්ථිකයේ යහපත පිණිස යෝග්‍ය යයි ජාතික මිල කොමිෂන් සභාව සලකන අවස්ථාවක, ඒ කොමිෂන් සභාව විසින් ඒ වෙළෙන්දා ඒ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා බඩු හෝ සේවා සඳහා වූ වෙළෙඳ පොලක් සැහෙන ප්‍රමාණයකට පාලනය කිරීමේ තත්ත්වයක් දරන වෙළෙන්දකු පිළිබඳ සඳහන් කිරීමට, වෙළෙඳ පොළෙහි ඔහුගේ කොටස් අයිතියෙහි හෝ කාර්මික ඥණය, අමුද්‍රව්‍ය හෝ ප්‍රාග්ධනය තිබීමත් සමග වෙළෙඳ පොළෙහි ඔහුගේ කොටස් අයිති යෙහි හෝ හේතුවෙන් ඒ වෙළෙඳ පොළෙහි බඩු හෝ සේවාවල සැහෙන කොටසක මිල තීරණය කිරීමට නැතහොත් නිෂ්පාදනය හෝ බෙදා හැරීම, පාලනය කිරීමට හෝ බලය ඇති වෙළෙන්දකු පිළිබඳ සඳහන් කිරීමක් ද ඇතුළත් වේ.

## II වන කොටස

## කොමසාරිස්වරයාගේ විශේෂ බලතල

ඇතැම් අවස්ථාගත කරුණු යටතේ කොමසාරිස්වරයා විසින් විශේෂ බලතල ක්‍රියාත්මක කළ හැකි බව.

24. (1) මේ පනතේ I වන සහ IV වන කොටස්වල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස්වරයා විසින්, අවශ්‍ය යයි තමා සලකන යම් පරීක්ෂණයකින් පසුව, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ දෙන ලද යම් විධානයක් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් නැතහොත් පඩි හා මිමි ආඥාපනතෙහි හෝ මිල පාලන පනතෙහි විධිවිධාන කිසිවක් හෝ යම් තැනැත්තකු විසින් කඩ කර ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, පළමු කඩ කිරීම සම්බන්ධයෙන් වන විට ඔහු විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් අවවාද කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අවවාදයක් කොමසාරිස් වරයා විසින්, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

## III වන කොටස

### අමාත්‍යවරයාගේ විශේෂ බලතල

ඇතැම් අවස්ථාගත කරුණු යටතේ අමාත්‍යවරයා විසින් විශේෂ බලතල ක්‍රියාත්මක කළ හැකි බව.

**25.** (1) මේ පනතේ කුමක් සඳහන් ව ඇත ද අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු මේ පනතේ යම් විධිවිධාන හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් නියමයක් හෝ පඩි හා මිමි ආඥා පනතෙහි නැතහොත් මිල පාලන පනතෙහි යම් විධිවිධානයක් හෝ යම් තැනැත්තකු විසින් කඩ කර ඇති බවට ඔහු සෑහීමට පත් වුවහොත් එම තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලු වත්කම් හෝ ඉන් කිසිවක් ඒවා ඔහුගේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය හා සම්බන්ධ වුව ද නොවුව ද රාජ්‍ය සන්තක කරන ලෙස ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද රාජ්‍ය සන්තක කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ නියමයේ දින සිට දින දහ හතරක් ඇතුළත ඒ නියමය සම්බන්ධයෙන් උචිත අධිකරණයෙහි නඩු පැවරීම, එසේ කිරීමට අදහස් කරන බවට අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දීමකින් පසු කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද රාජ්‍ය සන්තක කිරීමේ නියමයක් ඒ නියමයේ දින සිට දින දහ හතරක කාල සීමාවක් ඉකුත් වන තුරු හෝ ඒ නියමය සම්බන්ධයෙන් නඩුවක් පවරා ඇති අවස්ථාවක ඒ නඩුව අධිකරණය විසින් අවසානයට තීරණය කරන තුරු හෝ ක්‍රියාත්මක නොවිය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

ලියකියවිලි ඉල්ලා සිටීමේ බලය.

**26.** යම් නිෂ්පාදකයකුගේ හෝ වෙළෙන්දකුගේ ව්‍යාපාරයට අදාළ වූ හෝ නොවූ යම් වාර්තා, ශේෂ පත්‍ර, ගිණුම් ලේඛන, බඩු ලේඛන සහ වෙනත් තොරතුරු අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන්නේ නම් ඒ තොරතුරු ඔහුගෙන් ඉල්ලා සිටීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතු ය.

ඇතුල්වීමේ, පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලය.

**27.** (1) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ අනුව කටයුතු කරන්නේ ද යන්න නිශ්චය කිරීමේ කාර්ය සඳහා—

(අ) යම් නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු විසින් ස්වකීය ව්‍යාපාරය පවත්වා ගෙන යන ස්ථානයට හෝ වෙනත් යම් ස්ථානයකට දවසේ සියලු සාධාරණ වේලාවල දී ඇතුල්වීමේ, ඒ ස්ථානය පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ ද ;

(ආ) මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා කඩා විවෘත කිරීම යුක්තිසහගත ලෙස අවශ්‍ය යයි තමා අදහස් කරන යම් දොරක්, සුරක්ෂිතාගාරයක්, පෙට්ටියක්, බඩු මිටියක් හෝ ගබඩා කිරීමේ වෙනත් ස්ථානයක් කඩා විවෘත කිරීමේ ද ;

(ඇ) මේ පනතේ 13 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව එම ස්ථානයේ තිබී සම්භවන යම් භාණ්ඩයක් තහනමට ගැනීමේ ද ;

(ඈ) මේ පනත මගින් හෝ එය යටතේ හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ එය යටතේ හෝ එම ව්‍යාපාරය සම්බන්ධයෙන් තබා හැනිමට නියමිත යම් වාර්තා පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් ගැනීමේ ද

බලය කොමසාරිස්වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට හෝ සහකාර කොමසාරිස්වරයාට හෝ ඒ කොමසාරිස්වරයා, නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ සහකාර කොමසාරිස්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් රජයේ නිලධරයකුට හෝ තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ යම් භාණ්ඩ තහනමට ගනු ලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයකින් පසුව එම භාණ්ඩ රාජ්‍ය සන්තක කිරීම ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකින් අනෘප්තියට පත් යම් තැනැත්තා විසින් එම රාජ්‍ය සන්තක කිරීමට විරුද්ධව උචිත අධිකරණයෙහි නඩු පැවරීමට තමා අදහස් කරන බව ඒ රාජ්‍ය සන්තක කිරීමෙන් දින දහ හතරක් ඇතුළත දී ලියවිල්ලකින් කොමසාරිස්වරයා වෙත දන්වා සිටිය හැකි ය. ඒ අනුව 25 වන වගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නඩුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

28. (1) මේ පනතේ විධිවිධානවලින් කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් ක්‍රියා කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී වරදකරු කරනු ලැබූ විට—

(අ) පළමු වරද සම්බන්ධයෙන් වූ විට රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ද,

(ආ) තදනන්තර වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් හත් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද

ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අධිකරණය විසින් වරද කරන ලද්දේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩය රාජ්‍ය සන්තක කරන ලෙස ආඥා කළ හැකි ය.

(3) මෙ පනත යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන් ඒ ආඥාවෙහි නිශ්චිත කාලසීමාවක් තුළ යම් වෙළෙඳාමක දී හෝ වෙළෙඳ ව්‍යාපාර යක දී යම් භාණ්ඩයක් විකිණීමේ හෝ විකිණීම පිණිස ඉදිරිපත් කිරීමේ හෝ වෙළෙඳ ව්‍යාපාරය එම තැනැත්තා විසින් පවත්වා ගෙන යාම නොකළ යුතු යයි ආඥා කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ අධිකරණ ආඥාවක් කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(5) අධිකරණය විසින් (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ සෑම තැනැත් තකුගේ ම නම, ලිපිනය සහ විස්තරය කොමසාරිස්වරයා විසින් ඔහු සුදුසු යයි කල්පනා කරන ආකාරයකට ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ නඩු කටයුතුවලට අධිකරණයේ ප්‍රමුඛත්වය ලැබිය යුතු බව.

**29.** යම් තැනැත්තකු විසින් කරන ලදැයි කියනු ලබන මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන්, යම් අධිකරණයක නඩු කටයුතු වලට ඒ අධිකරණයේ අනෙක් සියලු කටයුතුවලට වැඩි ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩල විසින් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම.

**30.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කර ඇති අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ වරයකුව, සාමාන්‍යාධිකාරීවරයකුව, ලේකම්වරයකුව හෝ වෙනත් සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාගත මණ්ඩලයක් නොවන මණ්ඩලයක් නම්, වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම

ඒ වරද ඔහුගේ දැනුම හෝ අනුදැනුම නොමැතිව සිදු කරන ලද බවට ද, ඔහුගේ කටයුතුවල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු පිළිබඳව සලකන විට ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස ඔහු විසින් ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් ඔහු ක්‍රියා කළ බවට ද ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

අනුයෝජිත යන්ගේ සහ සේවකයන්ගේ වැරදි සඳහා ප්‍රධානයා වග කිව යුතු බව.

**31.** යම් නිෂ්පාදකයකුගේ හෝ වෙළෙන්දකුගේ අනුයෝජිත යකු නැතහොත් සේවකයකු විසින් මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක, ඒ වරද තමාගේ දැනුම නොමැතිව සිදු කර ඇති බව ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද ඒ නිෂ්පාදකයා හෝ වෙළෙන්ද විසින් සිදු කරන ලදැයි සලකනු ලැබිය යුතු ය.

නිලධරයන් ආරක්ෂා කිරීම.

**32.** මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකු විසින්, සද්භාවයෙන් කරන ලද හෝ මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ කටයුතු කිරීමෙහි ලා ඔහු විසින් සිදු කරන ලදැයි සලකනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට විරුද්ධව කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

ඇතැම් තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

**33.** යම් තැනැත්තකු මේ පනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක හෝ යම් භාණ්ඩයක් මේ පනත යටතේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරන ලෙස ආඥා කරනු ලැබූ අවස්ථාවක හෝ කොමසාරිස්වරයා විසින්—

(අ) ඒ වරදකරු කිරීමට හෝ ඒ භාණ්ඩය තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීමට හෝ තුඩු දුන් තොරතුරු සපයනු ලැබූ තැනැත්තාට ; සහ

(ආ) ඒ වරද අනාවරණය කර ගැනීමෙහි ලා හෝ ඒ භාණ්ඩය තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ සම්බන්ධ වුණු යම් තැනැත්තකුට

තමා සාධාරණ යයි සලකන යම් ත්‍යාග ගෙවනු ලැබිය හැකි ය.

නියෝග.

**34.** (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා විධිවිධාන බලගැන්වීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි ද, එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවක්ට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි ද, එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

**35.** ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 8 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි " අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව " යන වචන වෙනුවට " අමාත්‍යවරයා විමසා " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි 13 වන වගන්තියේ, ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

" (ඈ) 24අ වන වගන්තිය ප්‍රකාර යම් කාරණයක් පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීම." ;

(3) එහි 13 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ පනතේ 13අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" කොමිෂන් සභාව විසින් විශේෂ සැලකිල්ල දැක්විය යුතු කාරණා.

13අ. මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ස්වකීය කටයුතු කිරීමේ දී පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ල දැක්විය යුතු ය :—

(අ) භාණ්ඩ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ;

(ආ) භාණ්ඩ නිෂ්පාදකයන්ට අවශ්‍ය අනුබලය සලසා දීම ;

(ඇ) භාණ්ඩ නිෂ්පාදනයෙහි ලා හෝ සේවා සැලසීමෙහි ලා යොදා ගන්නා ලද ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සාධාරණ ප්‍රතිලාභ ප්‍රමාණ ලැබීම සහතික කිරීමේ අවශ්‍යතාව ;

(ඈ) රටේ විවිධ ආර්ථික කොටස් අතර සම්පත් බෙදා හැරීම ;

(ඉ) භාණ්ඩ නිෂ්පාදනයෙහි හෝ සේවා සැලසීමෙහි නැතහොත් භාණ්ඩ නිෂ්පාදනයට හෝ සේවා සැලසීමට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කටයුත්තක හෝ යෙදී සිටින පොදු සංස්ථා කාර්යක්ෂම ලෙස මෙහෙයවීම ;

(ඊ) උද්ධමනය පාලනය කිරීම ;

(උ) ආණ්ඩුවේ ආර්ථික සහ සමාජ ප්‍රතිපත්තියේ වෙනත් අරමුණු ; සහ

(ඌ) අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලැබිය හැකි යම් මාර්ගෝපදේශ." ;

(4) එහි 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (2) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන විභාගයට විෂය වන්නා වූ යම් කාරණයක් පිළිබඳව සම්බන්ධතාවක් ඇති, පාරිභෝගිකයන්ගේ සමිතිවල හෝ සංවිධානවල

නියෝජිතයන් ඇතුලු සියලුම තැනැත්තන්ට ඒ පිළිබඳව කරුණු කියා පෑමටත් කොමිෂන් සභාවේ මතය අනුව ඒ කාරණයට අදාළ වාචික වූ හෝ ලේඛනගත වූ හෝ යම් යම් සාක්ෂි ඉදිරිපත් කිරීමටත් කොමිෂන් සභාව විසින් අවස්ථාවක් දිය හැකි ය.";

(5) එහි 23 වන වගන්තියෙහි—

(අ) (1) වන උපවගන්තියේ "ඒ ගැන වාර්තා කළ යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ඒ ගැන වාර්තා කළ යුතු ය :

එසේ වුව ද අදළ නියෝජිත ආයතනය රාජ්‍ය සංස්ථාවක සභාපතිවරයා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයා හෝ නොවන තැනැත්තකු නම්, මේ වගන්තිය යටතේ යම් යොමු කිරීමක් අමාත්‍යවරයකු මගින් පමණක් කළ යුතු අතර එසේ යොමු කරන ලද යම් ප්‍රශ්න යක් කොමිෂන් සභාව විසින් විභාග කර ඒ අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය."; තව ද

(ආ) (2) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද එම අදාළ නියෝජිත ආයතනය රාජ්‍ය සංස්ථාවක සභාපතිවරයා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානයා හෝ වෙත් නම්, ඒ අදාළ නියෝජිත ආයතනය විසින්, ඒ නියමිත භාණ්ඩයේ මිල හෝ ඒ නියමිත සේවය සඳහා වූ ගාස්තුව හෝ වෙනස් කිරීම අවශ්‍ය යයි සලකනු ලබන ඉතාමත් හදිසි අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ නියෝජිත ආයතනය විසින් කරනු ලබන යොමු කිරීමක් මත කොමිෂන් සභාවෙන් වාර්තාවක් ලැබෙන තුරු, ඒ මිල හෝ ගාස්තුව වෙනස් කරනු ලැබිය හැකි ය.";

(6) එහි 24 වන වගන්තියෙහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත කරන ලද යම් වාර්තාවක් හෝ එවැනි යම් වාර්තාවක යම් නිර්දේශයක්,

අමාත්‍යවරයා විසින්, සුදුසු යයි තමා කල්පනා කරන ආකාරයට පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය.";

(7) එහි 24 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ පනතේ 24අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"භාණ්ඩ යනාදියෙහි මිලට අදාළ ප්‍රශ්න කොමිෂන් සභාව විසින් සමාලෝචනය කළ යුතු බව.

24අ. කොමිෂන් සභාව විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ එය වෙත වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ විසින් කරනු ලබන කරුණු දැක්වීමක් මත හෝ යම් භාණ්ඩයක මිලට හෝ යම් සේවයක් සඳහා වූ ගාස්තුවට අදාළ යම් ප්‍රශ්නයක් සමාලෝචනය කර, සාධාරණ යයි කොමිෂන් සභාව සලකන යම් කාලයක් ඇතුළත යම් අමාත්‍යවරයකු වෙත වාර්තා කළ හැකි ය.";

(8) එහි 33 වන වගන්තියේ "අදාළ නියෝජිත ආයතනය" යන්නෙහි අර්ථ නිරූපණය අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

'"අදාළ නියෝජිත ආයතනය" යන්නෙන්—

(අ) යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් එය යෙදෙන විට, ඒ භාණ්ඩයෙහි නිෂ්පාදකයා, ආනයනකරු හෝ බෙදා හරින්නා හෝ ඒ භාණ්ඩයෙහි මිල නියම කිරීම සඳහා වගකිය යුතු වෙනත් යම් තැනැත්තෙක් හෝ ඉන් අදහස් වේ ; තව ද

(ආ) නියමිත සේවයක් සම්බන්ධයෙන් එය යෙදෙන විට, රාජ්‍ය සංස්ථාවේ සභාපතිවරයා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ ඒ සේවය සලසන වෙනත් යම් තැනැත්තෙක් හෝ ඉන් අදහස් වේ.'.

1961 අංක 62 දරන වෙළෙඳුන්ට බලපත්‍ර දීමේ පනත පරිච්ඡින්න කිරීම.

**36.** 1961 අංක 62 දරන වෙළෙඳුන්ට බලපත්‍ර දීමේ පනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

**37.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

"භාණ්ඩය" යන්නෙන්, කොමසාරිස්වරයාගේ මතය අනුව ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වන්නා වූ ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් ඒ බවට නිශ්චය කර ඇත්තා වූ ද යම් ආහාර, පාන හෝ වෙළෙඳ භාණ්ඩයක් අදහස් වේ ;

" නිෂ්පාදකයා " යන්නෙන්—

(අ) භාණ්ඩයක් සාදන ;

(ආ) රසායනික ක්‍රියාවලියකින් වුව ද අන්‍යාකාරයකින් වුව ද යම් භාණ්ඩයක් එකලස් කරන හෝ සම්බන්ධ කරන ; හෝ

(ඇ) යම් භාණ්ඩයක් විකිණීම සඳහා යෝග්‍ය තත්ත්ව යට පත් කරන

යම් තැනැත්තෙක් අදහස් වේ ;

" ජාතික මිල කොමිෂන් සභාව " යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික මිල කොමිෂන් සභාව අදහස් වේ ; තව ද

" වෙළෙන්ද " යන්නෙන්—

(අ) විකිණීමේ හෝ සැපයීමේ කාර්ය සඳහා භාණ්ඩ ආනයනකරුවකු ලෙස ;

(ආ) විකිණීමේ හෝ සැපයීමේ ගිවිසුමක් ප්‍රකාර භාණ්ඩ අපනයනකරුවකු ලෙස

වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන යන යම් තැනැත්තෙක් අදහස් වන අතර ;

(i) වෙනත් යම් වෙළෙන්දන්ට තොග ගණනේ භාණ්ඩ විකුණන හෝ සපයන තැනැත්තෙක් ද

(ii) පාරිභෝගිකයන්ට සිල්ලර මිලට භාණ්ඩ විකුණන හෝ සපයන තැනැත්තෙක් ද

ඊට ඇතුළත් වේ.